# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.01.29 පැය 0745 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/ 165/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**හෙරොයින්, මුදල් සහ කාර් රථයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදුකර ගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුම් වලට අදාලව 2025.01.28 වන දින අළුයම් කාලයේ මුල්ලේරියාව පොලිස් වසමේ උඩමුල්ල ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත නිවසක වැටලීමක් සිදුකර **හෙරොයින් කිලෝ 02 ග්‍රෑම් 218 ක්, එම ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන මුදල් රුපියල් 667,000/- ක්, ජංගම දුරකථන 03 ක් හා මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීමට යොදාගත් කාර් රථයක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන මුල්ලේරියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

විදේශ රටක සිටින මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකුගේ මෙහෙයවීම මත සැකකරු විසින් මෙම මත්ද්‍රව්‍ය ජාවාරම සිදුකර ඇති බවට විමශර්නයේදී අනාවරණය වී ඇත. කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

අත්අඩංගුවට ගත් දේපලවල ඡායාරූප






**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**